# ඔබ හා මෙමා



පෙම් ලොව අසිරියත්, ඒ ආහ්ලාදයත් හිමිවෙන්නේ හුදෙක් පෙම්වතුනට පමණක් ම නො වේ. මංගල යෝජනාවලින් දැන හැඳින විවාපත්වන යුවලකට පවා ඒ ආහ්ලාදය, විවාහයෙන් පසුව පවා විඳගත හැකිය. හඳුනා ගැනීමෙන් පසුව හෝ පෙමින් බැඳෙන්නේ නම් නිතර අසන්නට ලැබෙන වියෝ ගී වල විප්‍රලම්භ ශෘංගාරය වෙනුවට පෙම් යුවලක් හෝ යෝජිත යුවලක් විවාපත් වන දිනයේ ලත් සතුට නිසා ඇතිවන සම්ප්‍රයෝග ශෘංගාරය දනවන පෙම් ගීයකි 'ඔබ හා මෙමා' ගීතය.

යුවති පතීන් අතිනත් ගන්නා විවාහ දිනය සැමට ම සතුටු දායක සුබ දිනයකි, ඒ යුවල එක සිතින් ම විවාහයට කැමැත්ත ඇතිව බැඳෙන්නේ නම් විවාහ චාරිත්‍ර අතර පෙරදිග චාරිත්‍ර වඩාත් ආකර්ශනිය වන්නේත්, හැඟුම්බර වන්නේත් ඒවාට මුසුවන සංස්කෘතිකමය වටිනාකම් සාපේක්ෂව වැඩි නිසයි. දෙමව්පියන්, ඥාතීන් අතර බැඳීම්ද වැඩි ලෙසින් පෙනෙන්නේ පෙරදිග ප්‍රජාවන් තුළ බවයි හැඟෙන්නේ.

කුල කුමරියක පති කුලයට යාමෙන් ඇයගේ සියලු භාරකාරත්වය, රැකවරණය සැමියා වෙත පැවරීමක් සිදු වෙයි. ඉදින් විවාහයෙන් පසුව ඇයගේ සියළු අවශ්‍යතාවයන් සොයා බැලිය යුතු වන්නේ මනාල මහත්මාටයි. මනාලයාගේ පවුලේ උදවිය සළකන්නේ තමන්ගේ පුතාට, සහෝදරයාට කැන්දාගෙන එන්නා වූ සහකාරිය තමන්ගේ පවුලට බැඳෙන තවත් දියණියක, සොයුරියක ලෙසින්. තමාගේ අනාගතය සතුටින් භාරගන්නා මනාලයා පිළබඳව මනාලියට ඇති වන්නේ ගෞරවයක්. ඇය පෝරුවේ චාරිත්‍රවලදී සිය සැමියාගේ දෙපා බදාගෙන නමදින්නේ චාරිත්‍රයටත් වඩා තම සිතෙහි උපින ගෞරවාදරය නිසාවෙන්. මේ අවස්ථාව ඕනෑම මනාලයෙකු සංවේදී කරවන්නක්. ජීවිතයේ කිසි දිනෙක අමතක නොවන සිදුවීමක්. 'ඔබ හා මෙමා' ගීය ඇරඹෙන්නේ ඒ සංවේදී අවස්ථාවේ හැඟුම් බර බව කැටි කර ගනිමින්.

ඔහුත්-ඇයත් අතින'ත අරගෙන ඔවුන්ගේම ලොවක තනි වූ දා ගැන ඔහු සිහිපත් කරන්නේ සෙනෙහසින්. පදවලින් කියැවෙන සැටියෙන් මේ කියැවෙන්නේ මංගල මධුසමය වෙනුවෙන් යුවල තනි වූ රාත්‍රිය ගැනයි. ඇය ඔහුගේ දෙපා බදාගෙන සිපගන්නේ, ඔහුගෙන් ඇය බලාපොරොත්තුවන රැකවරණය-සෙනෙහස නිසාමද? මධු සමය දා කාන්තාවක බවට පත් වෙන යෞවනියකට තවත් විවාහයක් පිළිබඳව සිතිය නොහැක. පෙරදිග ආචාර ධර්මවලට අනුව තමා වෙත සැමදා වන්දනීයත්වයෙනුයි ඇය සළකන්නේ.

බවයෙන් බවයට මේ දෙපළ මෙලෙස ආලයෙන් බැඳී එන්නට ඇති. ඒක කා හටවත් පෙර බවයේ බැඳීම් මතකයේ නොවේ. එහෙත් ඔහුගේත් ඇයගේත් හදවත් නමැති මන්දිරේ ඒ බැඳීම් නැවත මේ බවයේදී පැන නැගී ආවේ ආශ්‍රය නිසයි. ඒ ආශ්‍රයේ පළයකි මේ විවාහය. ඒ දිනය ඔහුට සිහිවෙනවා නිරතුරුවම.

දෑසින් දෑස බලාගෙන නිහඬව කරනා කතිකාව මේ යුවල සොයන්නේ සෙනෙහස. සැබැවින් ම කෙනෙකු තවකෙකුට අවංකවම ආදරය කරන්නේද යන්න පෙන්වන කැටපතක් ඇස් දෙක. එක එල්ලයේම එකිනෙකා බලාගෙන මේ යුවල සොයා බලන්නේ ඒ ආදරයයි. දෙනෙතින් එක්වෙන යුවල ගතින් ද වෙළී යන්නේ ඒ ආදරයෙන්. ඒ සොඳුරු දා අමතක කරන්නට නො හැකියි මේ විවාහක පෙම්වතාට.

ගේය පද නිබන්ධිකාවකගේ වළලු ලූ සුරතකින් ලියැවුණ ආදරණීය පද රචනාවකි මේ. ඇය විමලා රංජනී පීරිස් රචිකාවයි. කාන්තා සිතක ඇතිවන හැඟුම් සමුදාය ඉතාම සංයමයකින් යුතුව ඇය වචන වලට පෙරළන්නී, ගේයතා ගුණ ඇති පද රචනාවක මුතු ඇට පෙළක් සේ ඒ වචන අමුණන්නී ය.

මේ ගීයට සදාදරණීය තනුවක් නිර්මාණය කරන්නේ සෞම්‍ය සංගීත රටා මුසු කරන්නේත් දිවංගත එච්. එම් ජයවර්ධන ප්‍රවීණ සංගීත වේදියාණන්. 'ඔබ හා මෙමා' පළමු වදන් කීපය ම ආදරණීයත්වයේ නහවන තනුරචක ජයවර්ධනයන් සෑම වචනයෙන් වචනයකට ම ඒ ආදරණීය බව ගලාගෙන යන්නට ඉඩ හරින්නේ පුදුමාකාර සංයමයකින්. 'සිපගත්' වදනේදී හැඟුම්බර වෙනවා තනුව ඉහළ ස්වර කීපයක් ස්පර්ශ කරමින්.

බටනලාවෙන් ශිල්ප දක්වන්නට සුහුරුවෙකු වුණ එච්. එම්. ජයවර්ධනයන් මන්ද්‍ර ස්වර වැයෙන බටනළාවකින් සරළව අරඹන අතුරු වැයුමට එක් වෙනවා වයලින් පෙළක්. අනතුරුව සිතාර් තත් හඬ සරළව එකම ගැත් කොටසක් කීප වරක්ම වයන්නේ මෙතෙක් පසුබිමෙන් වැයුණු චෙලෝ හඬ නිහඬ කරවමින්. අතුරු සංගීතයමයි පෙර වාදනය ලෙසින් වැයෙන්නේත්. රිද්මය මදලයෙන් වැයෙන්නේ සංයමයෙන්.

අන්තරා කොටසේදී කෙමෙන් ඉහළ ස්වර කරා එළැඹෙන ගායනය උච්ච ම ස්ථානයක රැඳෙන්නේ 'ඔබගෙයි - මගෙයි' වදන් ගැයුමේදී. ඉන් අනතුරුව යලිත් මන්ද්‍ර ස්වර දක්වා ගායනය සෞම්‍ය වෙනවා.

අන්තරා කොටස් දෙක එකිනෙකට වෙනස්ව නිදහසේ ලියැවුණ පද රචනාවක් මේ. දෙවන අන්තරා කොටස් පද දෙකකින් කෙටියි. තනුරචකයා මේ කෙටි අන්තරා කොටසට තනුව යෙදීමේදී ඒ බව කා හටවත් නොදැනෙන සේ ගායනය යොමු කරවා ගන්නට සූක්ෂම වෙනවා.

හෙළ ගී කෙතේ ආදරණීය ම වූත් ගැඹුර වූත් හඬක් ඒ ආදරණීයත්වයත්, ගැඹුරත් මනාව කලතා විහදුවාලන්නට හඬෙහි හිමිකාර ප්‍රවීණ ගායන ශිල්පියාණන් සමත් වෙනවා. ඒ සියල්ල අතරින් ඉස්මතු වන්නේ ප්‍රේමණීය විවාහක සැමියෙකුගේ මධුර හඬක්. නියම ස්වරස්ථානවල රැඳෙමින් කවදත් සුගායනයක යෙදෙන මේ ප්‍රේමණීය ප්‍රවීණ ගායන ශිල්පියා වන්නේ ටී. එම්. ජයරත්න ශිලිපියාණන්.

*ඔබ හා මෙමා*
*අතිනත අරන්*
*අපගේ ලොවේ තනි වූ එදා*
*ඔබ මා දෙපා*
*දෑතින් බදා*
*සිප ගත් එදා සිහිවෙනවා......*

*බවයෙන් බවේ*
*මෙලෙසින් බැඳී*
*අප ආ ගමන් අමතක වුවත්*
*ඔබගෙයි මගෙයි හද මන්දිරේ*
*නැග ආශ්‍රයෙන්*
*එක් වූ දිනේ සිහිවෙනවා*

*ඔබ-මා දෙනෙත්*
*ම-ඔබේ දෙනෙත්*
*එක් වී වෙළී සෙනෙහස සෙවූ*
*ඒ සොඳුරු දා සිහිවෙනවා*

*ගායනය:* ටී. එම්. ජයරත්න
*තනුව හා සංගීතය:* එච්. එම්. ජයවර්ධන
*රචනය:* විමලා රංජනී පීරිස්



*සිසිර දිසානායක*